# ගණ දෙවි හැල්ල

# වදන් කවි පොත

# බු ඬ ග ජ්ජ ය

# ස ක ස් ක ඩ ය

# නරසීහ ගාථා

# නම් පොත

# මඟුල් ලකුණ

ගණ දෙවි හැල්ල

වදන් කවි පොත

බු ද්ධ ග ජ්ජ ය

ස ක ස් ක ඩ ය

නරසීහ ගාථා

නම් පොත

මගුල් ලකුණ

# ගණ දෙවි හෑල්ල

01.
ආයුබෝ වෙන සෙ තා
ඉසුරු වරමින් යු තා
උමාගන දළ නෙ තා
ඉසුරු එබිසෝ වෙ තා

02.
ගැබ කුමරු හට ග තා
දිනෙන් දින මෝර තා
දෙළ උපත හටග තා
රස මියුරු ගෙන දෙ තා

03.
එදෙළ සන්සිඳුව තා
එසත් මස පිරිග තා
දෙතන පුඬු කළු වෙ තා
කිරිබරින් සිට ග තා

04.
නව සඳෙව් රුවිනි තා
දස එකඩ මස වෙ තා
විළිරුදය පහරි තා
ගුරුදිනේ බිහිවෙ තා

05.
රේවතිය මෙනක තා
කඳ කුමරු නම් ල තා
ඔවුන් පුත් ගණ ප තා
ඔහුට තෙද බල ඇ තා

06.
තෙද නුවණ විකුමැ තා
රකුසන්ට බල ව තා
නරයන්ට සිරි දෙ තා
සුරිඳුන්ට අග ප තා

07.

එසිව්සැට සිල්පය ට
වැඩි සිල්ප දසට ර ට
නිපුණ කරවන ලෙස ට
මෙවැනි ගණදෙවිඳුහ ට

08.

වැඩ ඉන්ට නිසි ලෙස ට
මාලිගාවක් සොඳ ට
කරවන්ට නියම කො ට
ගණිත ඇඳුරකු ළඟ ට

09.

යවා පණිවිඩ එවි ට
ගෙන්නවා එනුවර ට
බිමක් බලවා සොඳ ට
එබිම සම කර සතු ට

10.

ඇඳුරුවරු එතන සි ට
කපා කප් සොඳ රඟ ට
ආ වඩා දෙපස සි ට
මඟුල් කප ගෙන අත ට

11.

වඩ වඩා සෙනෙහසි න්
මඟුල් කප සිටුවමි න්
දමා යට තලාදි න්
වනා පරහළ උම න්

12.

වෙළා නන බැඳ තදි න්
එරන් උළු සොයවමි න්
පද ලම ද තල තෙලි න්
මුඳුන කොත් සිටුවමි න්

13.

බිත්ති මැටි පදලමි න්
සුණු පදම් ලා ඔපි න්
මකර රුව හංසය න්
ගවර දිවි සිංහය න්

14.

මොනරු සහ ගිරවු ත්
කොබෙයියන් කුකුළනු ත්
පරවි සොඳ කොවුලනු ත්
ඇඳ බිත්තිවල මෙ සි ත්

15.

සිත්තරකු ගෙන්ව නා
ආසනේ තනමි නා
උඩුවියන් බඳිමි නා
වට තිරද අදිමි නා

16.

සේර අඩි තනමි නා
වළුමල් ද බඳිමි නා
නොයෙක් රුවනින් ම නා
සඳුන් මණ්ඩප ත නා

17.

දෙව්රුවක් තනම් නා
සොඬතලුද මුක ත නා
ඉස ඔටුනු දරම් නා
ගජතකුගෙ හිස මෙ නා

18.

දෙදළ කන්තල ත නා
නළල අඩ සඳ මෙ නා
දෙබැම දේදුනු මෙ නා
රුවින් සඳ සේ ම නා

19.

නුවන් නිලුපුල් මෙ නා
දෙතොල දළ පබළි නා
ගහණ රන් අකුසෙ නා
මුකය රන් පියුමෙ නා

20.

සවන් දෙක දිළිසෙ නා
දෙවුර රන් තොරණී නා
දෙඅත් ගනරන් මෙ නා
ඇඟලි රන් පළු මෙ නා

21.

පිටද රන් පලසි නා
ළමැද පිට බබළ නා
දෙතන රන් කුඹු මෙ නා
උදර කලසක් මෙ නා

22.

සිහිනිඟද බබළ නා
ඉඟට සළු බරණි නා
වටොර රඹ කඳ මෙ නා
දෙදන රන් බුබුලෙ නා

23.

කෙණ්ඩ දුනු කැකුළෙ නා
පතුල් පියුමක් මෙ නා
ළමැඳ රන් පාටි නා
විසිනියද බබළ නා

24.

සුරිඳු රජ විලසි නා
දෙව්රුවද බබළ නා
ආසනේ ඉඳුව නා
බලා සුබ මොහොති නා

25.

පහන් දුම් මල් ගෙ නා
සුවඳ සඳුනෙන් ත නා
ඇමතිවරු සිටගෙ නා
පල්ලිනම් තබම් නා

26.

අග්ගලා කොමලි නා
තලකැරලි විලඳි නා
මල්කැවුම් රොටියෙ නා
වෙල්ල වැසුමුත් ත නා

27.

පුලුබ් බෝජන ත නා
ලාලු යක්පැටියෙ නා
කිරිඋන්ඩ පූ ත නා
අත්සුණුද ඉසිම් නා

28.

මොර හිඹුටු දම් ප නා
අඹ දඹ ද ඇටඹ නා
පලු වීර ඩෙබරි නා
කදලි විලිකුන් ගෙ නා

29.

උක් සකුරු රස ත නා
වැල ද වරකා ගෙ නා
දී කිරිද වෙඬරු නා
මෙසේ බෝජන ත නා

30.

මෙවැනි ගණදෙවිඳු හ ට
රන් කෙණ්ඩියක් අත ට
රන්තලිය තබා සි ට
මව සුද්ද කර එවි ට

31.

වළඳවා සතුටු කො ට
කපුරු බුලතුත් සොඳ ට
සිත් සමා කර එවි ට
උදහසක් නොවී ම ට

32.

අදහසක් ඇතුව සි ට
අවසරය දෙන් මෙම ට
පින් සිද්ද වෙයි ඔබ ට
දෙවන් සිල්පය මෙම ට

33.

ගෙන්නවා ගුරු ඇදු රු
පය සෝදවා එගු රු
වතක් අඳවා සොඳු රු
උසක ඉඳුවා මහ රු

34.

තනා පස් රස මියු රු
කුසුම් හැම ඇඟ තැව රු
දෙවා බුලතුත් කපු රු
නමා ඉස දෙපය දැ රු

35.

ගුරුන් දෙස බලම් නේ
වැඳ වැටී එම දි නේ
අවසරය අරගෙ නේ
දැකුම් දී දකිම් නේ

36.

සෝඩිය ද ගෙනති නේ
කියා සිත් ලෙස දැ නේ
පිල්ලම් ද කියම් නේ
වැල්ලේ ද ලියම් නේ

37.

නම් ගමුත් කියම් ‍ ‍ ‍ ‍ ණේ
සැහැලිපොත් කියම් ‍ ‍ ණේ
වදන් කවි කියම් ‍ ‍ ‍ ‍ ණේ
බුද්දගජ්ජය දැ ‍ ‍ ‍ ‍ ණේ

38.

එපස්වා මෙපස් ‍ ‍ ‍ ‍ වා
දහස් කල් රකිත් ‍ ‍ ‍ ‍ වා
දිනේ මතු දිනේ ‍ ‍ ‍ ‍ වා
දිනේවා දිනේ ‍ ‍ ‍ ‍ වා

**ගණපති යාදින්න නිමි**

39.

ගණපති දෙති නුව ‍ ‍ ‍ ‍ ණා
මිහිකත් රකිති මෙදෙර ‍ ‍ ණා
දෙන්නේ මට නුව ‍ ‍ ‍ ‍ ණා
අසන් දෙවියනි
මේ දේවගු ‍ ‍ ‍ ‍ ණා

40.

ගණඳුරු දුරලව ‍ ‍ ‍ ‍ න්
නුවණින් නිපුන කරව ‍ ‍ න්
මෙ නරලොව දිනව ‍ ‍ ‍ ‍ න්
සසිරි ගණදෙවි
නුවණ මට දෙ ‍ ‍ ‍ ‍ න්

41.

පුදම් ආ ‍ ‍ ‍ ‍ ලංගා
සිතුසේ කරයි ‍ ‍ ‍ ‍ අංගා
මව් ද උම ‍ ‍ ‍ ‍ යංගා
වඳිම් ගණදෙවි
දෙහොත් ‍ ‍ ‍ ‍ නංගා

42.

ගණදෙවියෝ නුවණදෙ න්ට
සරස්වතී පහළ ව ‍ ‍ ‍ ‍ න්ට
සියලු රෝග දුරුකර ‍ ‍ න්ට
නිතර වඳිම් තුනුරුව ‍ ‍ න්ට

43.

සූරිය කුල තෙද උතු ‍ ‍ මා
පෑවිය සක්වලට හැ ‍ ‍ මා
කාරිය සිතුවාට ත ‍ ‍ මා
සූරිය දෙවි නමෝ න ‍ ‍ මා

44.

ඊෂ්වරා ලෙසින් ත ‍ ‍ මා
සාස්තරා දී නොප ‍ ‍ මා
ආස්පුරා ඇවිද ත ‍ ‍ මා
බාස්කරා නමෝ න ‍ ‍ මා

45.

චන්ද්‍ර සහෝදර උතු මා
චන්ද්‍ර කටක පැවති ත මා
සව්සිරි දී රකු මෙතු මා
චන්ද්‍ර සුරිඳු නමෝ න මා

46.

නිත්ත ඇවිද මෙරවට මා
සිද්ද කරන ලොවට සැ මා
උත්තම ගුණ නුවණ ත මා
සත්තලෝක නමෝ න මා

47.

ඔදැති තෙදැති සමාග මා
අරිති අරිති අඳුර ත මා
දෙවති දෙවති නුවණ ත මා
ජයතු ජයතු නමෝ න මා

48.

ගණිසුරු මහසෙන් කන්ද
ගෙන අඩයටි සුරති න්ද
දෙමි කී අඹ පල ස න්ද
මෙව්කුම් කුමරුගෙ කන්ද

49.

ඉසුරු උමා කී බසෙකි න්
මයුරාසන පිට නැගෙමි න්
සක්වල වට දිව සැණෙකි න්
සරණත කර මම නමදි මි

**ගණදෙවි හැල්ල නිමි**

# වදන් කවි පොත

01. පළමුව බුදුන් වැඳ
දෙවනුව දෙසූ දහම් වැඳ
මහ සඟ රුවන් වැඳ
පටන් ගනිමුව ගණදෙවිඳු වැඳ

02. ගණපති සුරන් වැඳ
ගුරුවර පහත් බැස වැඳ
දෙගුරුන් නැමී වැඳ
ඉඳුව වනපොත් දී පොතට වැඳ

03. බුත් සරණා වදනින්
දහම් සරණා වදනින්
සඟ සරණා වදනින්
මෙතුන් සරණා වදනින්

04. සම්මා සම් බුත්සරණා වදනින්
නව ලොවුතුරු දම්සරණා වදනින්
පිවිතුරු සව් සඟසරණා වදනින්
පැවතුම් මේ තුන්සරණා වදනින්

05. උතුමා නිති බුත්සරණා  වදනින්
පවරා සදහම් සරණා  වදනින්
සෙත ද යලි සඟසරණා  වදනින්
උවදුරු හැර තුන්සරණා  වදනින්

06. ස්වස්ති විභූෂණ කමලා  වදනින්
සිඬමලඞ්කෘත විමලා  වදනින්
අතුලිත මුනිවර චරණා  වදනින්
ආභා භාසුර කිරණා  වදනින්

07. ඉහ කුල පූජිත චරණා  වදනින්
ඊශ නිශාකර භරණා  වදනින්
උමා වධූපති මහිමා  වදනින්
ඌරු මනොහර ජඞ්ඝා  වදනින්

08. සෘණාජ නයනා මෘතයා  වදනින්
සෲකල්පායන කිරණා  වදනින්
ඏකුල සන්තති භුවනා  වදනින්
ඐම්හිපති මහිමා  වදනින්

09. එක බාහුබල ජිතයා  වදනින්
ඓරාවන පූජිතයා  වදනින්
ඔෂ්ට්‍ර මනෝහර ජඞ්ඝා  වදනින්
ඖපගවස්මි කෘතයාවදනින්

10. අංප්‍රෙඩිත විධි කුසලා  වදනින්
අස්තු නමෝජන තිලකා  වදනින්
අඃකී අක්ෂර ෂෝඩශ  වදනින්
සිඬම් වේචා ගණපති  වදනින්

11. අගරජ සුරරජ මුනිරජ වදනින්
මුතුහර ගෙළදම් දම්රජ වදනින්
උරද ණේනය මුනි සුත වදනින්
සිළුමින් සිතුමින් තිසරණ වදනින්

12. ක ඛ ග ඝ ඞා ච ඡ ජ ඣ ඤ වදනින්
ට ඨ ඩ ඪ ණ ත ථ ද ධ නා වදනින්
ප ඵ බ භ මා ය ර ල ව ශ ෂ වදනින්
සහළා අං ඉති සිද්ධිරස්තු වදනින්

මෙහි ඉහත දැක්වූ කවි කියවීමෙන් සම්පූර්ණ හෝඩියේ අක්ෂර පුහුණු වන බව පෙනේ.

13. අ ව න පටන් අඃ වන්නට වදනින්
දැ නෙ න සොළස සොරකුරු පෙළ වදනින්
ක ය න එපස් වග යානව වදනින්
මෙ ව න සුතිස් දනු හසකුරු වදනින්

අ යන්නේ පටන් අඃ යන්න දක්වා ඇති අකුරු දහසය ස්වරාක්ෂර හෙවත් ප්‍රණාක්ෂර වේ. කවර්ගය ආදී වර්ග පහේ අකුරු විසි පහ ද ය යන්න ආදී කොට ඇති අකුරු නවය ද යන ගාත්‍රාක්ෂර තිස්හතර හ්‍රශවාක්ෂර හෙවත් අල් අකුරු නම්.

අ යන්න පටන් අඃ යන්න දක්වා ඇති අකුරු දහසය මෙසේයි:

අ, ආ, ඉ, ඊ, උ, ඌ, ඍ, ඎ,
ඏ, ඐ, එ, ඓ, ඔ, ඖ, අං, අඃ

කවර්ගය - ක, ඛ, ග, ඝ, ඞ
චවර්ගය - ච, ඡ, ජ, ඣ, ඤ,

ට වර්ගය - ට, ඨ, ඩ, ඪ, ණ
ත වර්ගය - ත, ථ, ද, ධ, න
ප වර්ගය - ප, ඵ, බ, භ, ම,
ය යන්න ආදී කොට ඇති අකුරු නවය නම් - ය, ර, ල, ව, ශ, ෂ, ස, හ, ළ යනුයි.

14. එක් සොර පස්වග යරලව සත රා
ශ ෂ ස හ එකකුරු ළයනෙක අකු රා
සු රු ව ත් සමහරු නොදනිති ඉඳු රා
සෝඩියෙ බරකුරු දැනගන් සපු රා

සෝඩියේ දෙළොස් අකුරු මෙසේයි :-
සියලුම ස්වරාක්ෂර එකකුරෙකි
වර්ග පහ පස්කුරෙකි.
ය, ර, ල, ව, යන සතර සතර කුරෙකි.
ශ, ෂ, ස, හ යන සතර එකකුරෙකි.
ළකාරය හෙවත් ළ යන්න එකකුරෙකි.
සම්පූර්ණ හෝඩිය අකුරු දෙළොසෙකි.

15. කණ්ඨජ සත අ හ ක වගය වදනින්
තා ලු ජ සත ඉ ය ච වගය වදනින්
මූ ර්ධ ජ සත ර ළ ට වගය වදනින්
දන් තජ සත ල ස තවගය වදනින්

කණ්ඨජ හෙවත් බොටුවෙහි උපදින අක්ෂර - ක ඛ ග ඝ අ ආ හ තාලුජ හෙවත් තල්ලේ උපදින අක්ෂර - ච ඡ ජ ඣ ඉ ය මූර්ධජ හෙවත් මුදුනේ උපදින අක්ෂර - ට ඨ ඩ ණ ර ෂ ළ දන්තජ හෙවත් දත්වල උපදින අක්ෂර - ත ථ ද ධ න ල ස

| | | |
|---|---|---|
| 16. ඔ ෂ් ඨ ජ | සය උෟ ප වගය | වදනින් |
| තා ලු ජ | කණ්ඨජ ඒ කුරු | වදනින් |
| ක ණ් ඨ ජ | ඔෂ්ඨජ ඕ කුරු | වදනින් |
| ද න් ත ජ | ඔෂ්ඨජ වෝකුරු | වදනින් |

ඔෂ්ඨජ හෙවත් තොල්වලින් උපදින අක්ෂර - ප ඵ බ භ ම තාළුජ, කණ්ඨජ හෙවත් තල්ලෙන් සහ බොටුවෙන් උපදින අක්ෂර කණ්ඨජ ජොෂ්ඨජ හෙවත් බොටුවෙන් සහ තොල්වලින් උපදින අක්ෂර දන්තජොෂ්ඨජ හෙවත් දත්වලින් හා දෙතොල් වලින් උපදින අක්ෂර

| | | |
|---|---|---|
| 17. මු දු | න ය දසනය උපදින කුර | ටා |
| යෙ දු | තාලුජයද සෙසුකුරු වල | ටා |
| ල දු | අග මැඳ දිව දුනු තැන් ලෙස | ටා |
| හඳු | නව කරණය කීලෙස කුර | ටා |

අක්ෂර කියවීමට උපකාර වන ස්ථානය කරණය නම් වේ. මුඳුනේ ද දත්වල ද උපදින අක්ෂරයන්ට දිව කරණය වේ. තල්ලෙන් උපදින අක්ෂරයන්ට දිවමැද කරණය වේ. යනාදී වශයෙනි.

| | | |
|---|---|---|
| 18. මේලෙස | කුරු උපදින තැන් | දනුවා |
| ආ ලෙස | අකුරට කරණය | දනුවා |
| වූ ලෙස | ඒකජ දිජකුර | දනුවා |
| කී ලෙස | ගරුකය ලහුකය | දනුවා |

මෙසේ අක්ෂර ඉපදීමට උපකාර වන ස්ථානය හෙවත් කරණය අ යන්න ආදී එක තැනින් උපදින ඒකජාක්ෂරද ඒ යන්න ආදී දෙතැනින් උපදින ද්විජාක්ෂරද පූර්වාචාර්යයන් විසින් කී පරිද්දෙන් ගුරු ලඝු දත යුතු.

19. එ ක් වූ අකුරට පෙර කුරු නිති නා
ව ක් වූ ගුරු දිගුබව දනු නැණි නා
දැ ක් වූ නොමවන සිටි එක් මති නා
දැ ක් වූ පෙර ඉසි ලුහු යයි දැනෙ නා

බැඳි අකුරකට පූර්වයෙන් සිටි අකුරු ද දීර්ඝාක්ෂරය ද ගුරු වේ. වංක රේඛාවෙකින් ගුරු අක්ෂර ලකුණු කරනු ලැබේ. දීර්ඝ නොවූ එක මාත්‍රයෙකින් යුත් අක්ෂර ලඝු වේ. (ලඝු අක්ෂර ඍජු රේඛාවෙකින් ලකුණු කරනු ලැබේ.)

20. එ ක ම ත ලුහුයයි දැන කියම් න්නේ
යු ග ම ත දිගුයයි ගුරු පවස න්නේ
වෙන මත තුනෙකින් පුලුත කිය න්නේ
අ ඩ ම ත දැනගන් හසකුරය න්නේ

මාත්‍රා එකක් ඇති අකුර ලඝු නම්. මාත්‍රා දෙකක් ඇත්තේ ගුරු නම්. මාත්‍රා තුනක් ඇත්තේ ප්ලුත නම්. හල් අකුරු වල අර්ධ මාත්‍රා හෙවත් මාත්‍රාවෙකින් දෙකෙන් පංගුවක් ඇත්තේ වෙයි. (මාත්‍රාවක නම් ඇසි පිය හෙළන කාල ප්‍රමාණය බව දත යුතුයි.)

21. අ ව න ය ආදී ඒකජ අකුරු
එ ව න ය අෑ දනු දිජ නම් අකුරු
දෙ ව න කවග සහ ලහුකය අකුරු
එයිනැර සෙසුකුරු ගරුකය අකුරු

අයන්න ආදී එකතැනින් උපදින අක්ෂර හෙවත් ඒකජාක්ෂර ද ඒ යන්න ආදී දෙතැනින් උපදින අක්ෂර හෙවත් ද්විජාක්ෂර ද දත යුතුයි. කවර්ගය ආදී වර්ගයන්ගේ දෙවෙනි අකුරු ලහුක නම්. ඉතිරි අක්ෂර ගරුක නම්.

22. ගනිමින් පස්වග පළමු දෙවන කු ර
සමඟින් සයනුද අගොසය කිව් පෙ ර
ළයනන් තව සෙසු කුරු යයි ගොසකු ර
දැනගන් මේ ලෙස සෝඩියෙ දෙයකු ර

කවර්ගාදී වර්ග පසේ පළමුවැනි දෙවෙනි අකුරු හා ෂ ශ ස යන තැන ද අඝොෂාක්ෂර වේ. ළ යන්න අන්තකොට ඇති අනික් අක්ෂර ඝොෂාක්ෂර වේ. මෙයාකාරයෙන් හෝඩියේ ඝොෂාඝොෂාක්ෂර දත යුතුයි.

23. ගොස කුරු නොම ගොසකුරු යන දෙ වගෙකි
තොස වන දනිතය සිතිලය දෙ වගෙකි
නි ස සය නිසිතය යනකුරු දෙ වගෙකි
බ ස පෙර ඇති සෝඩියෙ කුරු දෙ වගෙකි

හෝඩියේ ඝොෂාඝොෂ කියා අක්ෂර දෙවර්ගයක් ද ධනිත ශිථිල කියා දෙවර්ගයක් ද නිශ්‍රය නිශ්‍රිතය කියා දෙවර්ගයක් ද පෙර පටන් පැවතෙයි.

24. ප ස් ව ග යුගසිව් දනිතය ද න් නේ
එ ම ව ග වල එකතුන පවස න් නේ
නොව ළඟ සිතිලය දැන කියමි න් නේ
මෙ ම ව ග කුරු පෙළ තෝරා දෙ න් නේ

වර්ගයන්ගේ දෙවෙනි හතරවැනි අකුරු ධනිතාක්ෂර වේ. පළමු වැනි තුන්වැනි අකුරු ශිථිලාක්ෂර වේ.

25. සි ත රා එක්කටයාදී නව කු රු
නොහැරා දනු එක් පාදී පස කු රු
වි ත රා සොර එක් එක් සුන් දෙයකු රු
ස පු රා දැනගන් සෝඩියෙ සිවුකු රු

කයන්න ටයන්න යයන්න ආදී කොට නවය බැගින් ඇති අක්ෂර එක අකුරෙකි. පයන්න ආදී පස එක අකුරෙකි. සියලුම ස්වරාක්ෂර එක අකුරෙකි. ශූන්‍යාක්ෂර දෙක එක අකුරෙකි. පයාදි වශයෙන් හෝඩියේ අක්ෂර සතරකට බෙද තිබේ.

26. ප න සෙ ක    සොර සහ හස දෙවගි    න්   නේ
එ හි එ ක    එක හසකුරු සද මි    න්   නේ
සොළොසෙක    සොර ලූ කල ගණනි    න්   නේ
නො ව සැ ක    පන්සිය සැටකුරු ද    න්   නේ

හෝඩියේ ස්වරාක්ෂර සහ හල් අකුරුත් පනසෙකි. එයින් එක හල් අකුරට ස්වරාක්ෂර සොළොස බැගින් ලූ කල අක්ෂර පන්සිය හැටෙක් වෙයි.

27. සෝඩිය සූතිස් පිල්ලමකා    දී
ලූකල සොරයන් සොළොසක් ආ    දී
ගණනින් පන්සිය සැටෙකින් සුසැ    දී
අකුරෙන් සතලිස් සතරක් බේ    දී

කයන්න ආදී කොට ඇති ගාත්‍රාක්ෂර තිස්හතරකට ස්වරාක්ෂර දහසය ලූ කල සෝඩියෙහි අක්ෂර පන්සිය හැටක් වේ. සේඩියේ අක්ෂර වශයෙන් හෙද හතලිස් හතරෙකි.

28. පෙ ර    හස පර සොර සද නොව වෙනස    ක්
ක ර    වියරණ විදි දැන ඇති විලස    ක්
කුරු    හස එකකට වැඩි විය සොළොස    ක්
ති ර    කුරු මඟ දැනුමට වැනි දිවැස    ක්

29. සෝඩිය පටන් ගෙන වන පොත් කරව දැ    නා
පිල්ලම් කියා අල්පිල් අකුරු දැනගෙ    නා
ලියා අකුරු වැල්ලේ ගෙඩි නොකා දැ    නා
ඇණවුම් සකස්කඩ සකසේ ඉගෙන ගෙ    නා

30. තිබූ තැනෙක සොර සතුරන් ගත නොහෙ    නා
එ සැඩ මනා වත් වතුරෙන් වල නො හෙ    නා
කෝප වුවත් රජ මැතිඳුන් ගත නො හෙ    නා
උගත මනා ශිල්පයමයි මතු රැකෙ    නා

31. අ ල් ලට සිඟා වත් රස නැති කැවිලි ක    කා
වල් කොළ බිම අතුට නිදි නොලැබ දුක් ත    කා
කල් ගිය රෙදි වැරලි ඇඳ දැලි කුණෙන් ව    කා
ඇල් මෙන් අකුරු උගනිව් ඉදිරි වැඩ ත    කා

32. ක සේ    සැමිටි වේවැල් ඉරටු ගෙන අ    තේ
ඇ සේ    කදුළු අකුරට ගිය කලට ග    තේ
බ සේ    මියුරු තෙපලති දෙගුරු සවන    තේ
ද සේ    පසේ ගෙඩි දෙති පිටට එක ර    තේ

33. වේවැල් කෝටු නාරන් සියඹලා අ    තු
කිතුල් පොල් ඉරටු වැල් කසඹිලිය අ    තු
මෙහැම ඉපල් මගෙ දෑසට නොපෑ යු    තු
පමා නොවී එම් අකුරට මෙයින් ම    තු

34. පොල් ඉරටේ අණ තදකර ගති    මි    මා
ඉන් ඔල මොළ කමකට සිත නොල    මි    මා
දැන් නිසලව ඉඳ අකුරුත් කිය    මි    මා
ඉන් අප දඟගේක ලූ දෑය අ    මි    මා

35. අම්මොයි කියා ගෑ සියලග තෙල් රුව ට
යම්මොයි කියා යති අකුරට ගුරුන් ගෙ ට
බම්මොයි කියා බස් තෙපලති විටින් වි ට
අම්මොයි කියා කීවත් ගුරු දෙතැයි බැ ට

36. රු ප් පා වල ඉඳ කෙළිනා දවස් දැ ඩි
තැ ප් පා සේ ම ගිනි උසුළද්ද මැඩි මැ ඩි
අ ප් පා උකුළ ඉඳ තෙපලන බස් ම දැ ඩි
අ ප් පා බලා උන්නත් වළකී ද ගෙ ඩි

37. ගණදෙවි කෝවිල පිරිබඩල න් නේ
දත මැඳ පිරුවට ඇඳ පේව න් නේ
කළ කී දේ මට සාද දෙ න් නේ
පින් ඇති ගණදෙවි නුවණක් දෙ න් නේ

38. කිරි දී වෙඬරු ද පස්ගෝ රසි නා
උඳු මුං තල මෑ කරලින් සොබ නා
මේ නම් කැවුමෙන් නිති පුද ලබ නා
දෙන් මට නුවණක් ගණදෙවි යෙහෙ නා

39. අඹ දඹ ඇටඹද කරඹ ද පුද මී
ඔලු පලු ලාලු ද ගිවුළු ද පුද මී
අතිරස අක්ගල අත්සුණු පුද මී
ගණදෙවි නුවණක් දෙනු පා විඳි මී

40. පු ද විලඳ අතිරස කිරිබත් සකු රා
ස ද මල් බුලත් පුවකුත් ලා කපු රා
වි ද වතක් සොඳ අඳවා ගුරු ඇදු රා
මෙදැ න කළෝතින් වැඩ වෙයි සවි ඉසු රා

41. පුදමි මම ඔබට පස් පඬුරෙන් ම ස රා
අඹ දඹ කෙසෙල් පලවැලයෙන් ම තටු පු රා
ගොම පිරි බඩ මල් පහනින් ම සිත් පු රා
දෙවන් මට නුවණ ගණදෙවිඳු පින් පු රා

42. වැ ඳ ලා දෙවියන් පොත අර ග න් නේ
යැ ද ලා ගුරුනුත් සිත නොත ල න් නේ
ස ක ලා සිල්පය මට සෑදෙ න් නේ
දැ ක ලා ගණදෙවි නුවණක් දෙ න් නේ

43. සොඳින් බැබළි ගජමුණෙකි ප ත් මේ
තෙදින් විදුරු විත්නා නුවණැ ත් මේ
යෙහෙන් නැඟුණ මී වාහන යු ත් මේ
වඳිමි එගණදෙවි සිරිපද ප ත් මේ

44. සුදු දළ ගජ සොඬ මුණෙකි ප ත් මේ
සුදු මීමකු නැඟෙමින් වැඩ ග ත් මේ
සොඳ උමයංගන ඉසුරුගෙ පු ත් මේ
වඳිනෙමි ගණදෙවි සිරිපද ප ත් මේ

45. අකුළාගෙන සොඳ ගජතකු වැ න් නේ
නෙරවා කන්පොතු සුළු කුළු වැ න් නේ
සියලඟ ගෝමර මල්පෙති වැ න් නේ
පින් ඇති ගණදෙවි නුවණක් දෙ න් නේ

46. අඹ ගෙඩියක් උදෙසා තම චි ත් තේ
ලොබ කොට දිව ගොස් දළ බිඳ ග ත් තේ
ඔබටම මම දැන් ගැති වෙමි නි ත් තේ
සුබ නුවණක් කිම දෙනවා නැ ත් තේ

47. නුවණා මෙමට දෙන සොඳ උම යං ගා
සිව් සැට බරණින් සැදි සිව ලිං ගා
පුදනෙම් අක් සුණු ගෙන ආ ලං ගා
දෙන් මට ගණදෙවි නුවණා නො සං ගා

48. පු රු දු කරන සව් සත නම පුරු දු
ප සි ඳු ව නුවණක් ලබනට ඔබ ඳු
ගි රි ඳු ඉසුරු හට ද කර එ වැ දු
ග ණි ඳු න් සිරිපද නමදිම් පසි ඳු

49. ර න් වන් අංකුස සුරතින් ගෙන නි ති
බු න් දත් සිවු අත් ගජ මූණක් ඇ ති
තු න් නෙත් නන්දන කරවන වික්මැ ති
දෙ න් දැන් නුවණක් ගණපති පින් ඇ ති

50. ම න් මද ගජ කුඹු වත අත දික් ක ළ
පු න් සඳ මෙන් සිරි උදුළෙව් පුත් ක ළ
ක න් තල මිණිරුසු ගණපති පින් ක ළ
දෙ න් මට නුවණක් සමුදුර මෙන් ර ළ

51. මූෂික වාහන මෝදක හස් තුම්
චාමර කණී විලම්බිත සූ තුම්
වාමන රූප මහෙශ්වර පු තුම්
වී ඝන විනායක පාද නමස් තුම්

52. අ ව න ත සුරගණ විකලිත චරණ මි
ඝ ට න ට විගලිත මද ජල මුදිත මි
වි ක සි ත කර රුහ කරතල කමල මි
ප්‍ර ණ ම ත ශිව සුත ගණපති මහය මි

53. කුඞ්කුම වර්ණ චතුර් භූජ යුක් ත මි
නාග මුඛම් මකුටාඞ්කිත ශුණ්ඩ මි
අංකුස පාශක හස්ත සුපාද මි
වහ්නි දෘශං ගණ නාථස්‍ය රූප මි

54. සූ රි ය කුල ඇති ඉරු දෙවි ය න් නේ
පෑ වි ය අණසක ලොව පව ති න් නේ
කා රි ය සිතුවා සාද දෙ න් නේ
සූ රි ය දෙවියනි නුවණක් දෙ න් නේ

55. බ බ ළා උදය ගිරි මුඳුනෙන් වඩි න් නේ
නො ව ළා අඳුරු බිඳ ලොව එළි කර න් නේ
දැ ක ලා සියලු රෝදුක් දුරු කර න් නේ
මෙ කලා සොඳින් ඉරු දෙවි මා රකි න් නේ

56. සී තා පති රජුමෙන් ගුණ උ ත්තම
බී තා ජනයන් දුර කර නි ත්තම
ඈ තා පිරිපත හරිමිනි නි ත්තම
නා තා සාමිනි රකු මා නි ත්තම

57. මෙන් දිඩ ගිරි සිරි පිරි සිරි ල ත්තම
තු න් තුඩ තුති යස ගොස කර නි ත්තම
මන් මැඩ මරු මතු බුදුවන උ ත්තම
සෙන් කඩ ගල සුරිඳුන් වඳු නි ත්තම

58. ලොව සෙත් කර වන පත්තිනි සඳි නේ
සළඹත් අරගෙන සලු සලවමි නේ
වෙනසක් නො සිතා මගෙ ගුරු වරු නේ
ආසිරි නුවණක් දී මා රකි නේ

59. ම න්    ලෙස නමදිම් සරණාත කර පෙ    ම
න න්    ලෙඩ රෝදුක් පිරිපත දුර ද    ම
දැන්    මෙ වදන් කවි කියම් බොළඳ ම    ම
දෙන්    මට නුවණක් සුරිඳු කතර ග    ම

60. මුදු අසල් බඩ සිටිනා එ නුව රෙ    කී
ඉස බැඳි ඔටුන්නෙන් සැදුණෝ රජරුවෙ    කී
දෙපා පියුම් පෙති සුරතට රණෙන් වැ    කී
ඇඳින ගොසින් වඳු දෙව්රජ මේ ලෙස    කී

61. තැඹිලි තඹුනෙල් නවසි බෝදිලි
තල් කිතුල් ඉඳි කැන් ම    නා
ලේනතැරි දෝතළු පුවක් වලු කදලි
සුවඳෙල් සමඟි    නා
ලබු පුසුල් නාරන් දෙඩම් අඹ රසැති
වැල වරකා ගෙ    නා
තෙදැති ගණපති නුවණ දෙන් මට
පුදම් මේ හැම සිතු මෙ    නා

62. තා නු  තරුණ අරුණ කිරණ බරණින් යස තේජ    නේ
බා නු අසුර අසුරන් යුද ඔදවැඩි ගිරි රාජ    නේ
මූ ණු  සයෙකි අත් දෙළසෙකි මයුරාපිට වාහ    නේ
රූ ණු රටේ පිහිටි කන්ද කදිරදේව රාජ    නේ

63. බලවර්ද්දන    තුඟු පාබල සිරිනුත් ගිරි රාජ    නේ
නැගී දුර්ජන    අසුරන් දප බිඳ හැරි සිහ රාජ    නේ
තොස වර්ද්දන    මුණුසයෙකි නැඟිසිකිනිඳු වාහ    නේ
ජ ය ව ර් ද න නුවර පිහිටි කදිරදේව රාජ    නේ

64. සි ද් ද රන් දුනු තදව ගනිමින් එරන්
හීයක් අරගෙ නා
ස ද් ද වූ ලෙස ගොසය කරවා මඟුල්
පෙර හැරයෙන් ය නා
යු ද් ද වූ තද රොසින් දස හිස්
රාවණා බිඳ ජයගෙ නා
ඇ ද් ද තව මට වෙනින් පිහිටක්
කතරගම සුරිඳුන් වි නා

65. කතරගම පුර පවර යස තෙද
විහිදුවන දිවයුරා ණන්
සකල සිරිලක දෙවි නරන් හට
පැවත එන සොමි සඳා ණන්
පඳුරුැලන කෙත් ගොයම් විලසට
නුවණ මට දෙන රජා ණන්
අඳුරු රිපඳුරු පදට ගුරුමට
කතරගම දෙවි රජා ණන්

66. කදිරනේ කළ බරණිනේ තුනු
සැරසුණේ පිරි සුවඳි නේ
තෙදණිනේ මිණි දුනු ගෙනේ අත
පොළමිනේ විදුලිය මෙ නේ
වි දි ර නේ සැර එකතිනේ සැඩ
අසුරනේ දප මඩිමි නේ
ක දි ර නේ දෙවි උතුමනේ සව්
සිරි දෙනේ රකු මා දැ නේ

67. ක ත ර ණේ රුව බබළමින් සිට
සුසැට බරණින් සි රි ස රා
අ ත ර ණේ දුනු රැගෙන නිතියෙන්
මයුර වාහන පිවිතු රා
කොතර ණේ රන් මාලිගාවට
වැඩම කරවා විසිතු රා
ක ත ර ණේ දෙවි ඝරණිනේ මට
නුවණ ගෙණ දෙන් පින් පු රා

68. රෑනු රට කදිරා පුරා දිප මුණු සය ඇති
දෙවි රජා ණෝනි
ආනු බාවෙන් මෙමට සිල්පය
සිද්ද කර දෙන සමුදුරා ණෝනි
බානු තෙදබල සව් සතුන් හට
එළිය කර දුන් සොම් සඳා ණෝනි
දී නු වණ සිරි දිනෙන් දින රකු
කතරගම පුර දෙවි රජා ණෝනි

69. ස යු ර මෙන් රැළ නෙපුද පෙරහර
ඉසුරුවන විමනේ සුර න්
ප තු ර වන තද තෙදින් අධිපති
මෙ සිරි ලක හිමි දෙවි නර න්
නි ත ර සෙත් දී බලා දිවසින්
නොයෙක් රෝදුක් දුරු කර න්
ප ත ර යසසිරි නුවණ දෙන් මට
කදිර පුර දෙවි රජුනි දැ න්

70. ඈ ත කප් කෙළ ගණන් බුදු බව පතා
විවරණ ලදින් සහ තු ට
වී ත රාගත් එර්දි නුවණත්
ආයුවර්දන කරන හැම වි ට
පා ත තොටගමු විහාරේ වැඩ
සිටින දෙවියනි දහම් සිහිකො ට
දෝ ත මුදුනේ තබා වැන්දෙමි
නාත දෙවි රජ නුවණ දෙන් ම ට

71. සි ද් ද කිහිරැලි සමන් බොක්සැල්
විභීෂණ සිව් වරම් රජ නි ති
සි ද් ද මහබඹු ශක්‍ර ඉසිවර
කතරගම දෙවියනුත් සිත රැ ති
සි ද් ද පත්තිනි දෙළහ දෙවියෝ
භද්‍රකාලී දේවි ගණ ප ති
සි ද් ද සිරිලක මෙ හැම දෙවියෝ
මෙ මට ආසිරි දිගා දෙත් නි ති

72. දි ලු ත් දිමුතු රිවි මෙන් තෙද
පරසිදු මුළු සක්වල ව ට
ම ලු ත් පහන් සමග පඬුරු
පුද ලැබ වැජඹෙන සහ තු ට
නි ලු ත් රතිනි සුදින් දිලෙන
රන් කොත් කැලුමෙන් හැම වි ට
අ ලු ත් නුවර පුල් වන් දෙවි රජුනි
නුවණ දෙවන් මෙ ම ට

| | | | |
|---|---|---|---|
| 73. | තුන්තරා | වැඩ මුනිඳු ගඟ පැන් | |
| | | සනහමින් රැඳි කැල | ණියේ |
| | ගං තරා | අස්වීදි දෙපසේ | |
| | | පිළිම ගෙවලින් ගිහි | ණියේ |
| | ඉන් පුරා | ලූ දතු දළඳා | |
| | | දගබෙයි සිරි පැමි | ණියේ |
| | ඉන් පුරා | ඔබ වෙහෙර වැන්දෙමි | |
| | | නුවණා දෙන් දෙවි කැළ | ණියේ |

| | | | |
|---|---|---|---|
| 74. | ස ත ත | හරි හර විතත මුනි යුධ | |
| | | මේබලා ගිරි ශෝභ න | මි |
| | ස ව ත | ශිව ශිව රූප නිර්මල | |
| | | වහ්නි ශෝභන සන්නි භ | මි |
| | උ භ ය | රවිකුල මේරු සිංහල | |
| | | ධාරි නිර්මිත ධාරි ණ | මි |
| | ධ ර ණි | ධර ධර භවති භව භව | |
| | | නරසිංහ රජ නාරණ | මි |

# බු ද්ධ ග ජ්ජ ය

01.
නමඃ සමනත භද්‍ර ය
සර්වගොචර චකෂු ෂෙ
කරුණාමෘත කල්ලො ල
සිද්ධවේ සූර්ය බන්ධ වෙ

02.
ජය ජය ධර්මරා ජ
ජනකෘත ශර්මපූ ජ
අසදෘශ බුද්ධ ලී ල
අති පරි ශුද්ධ ශී ල

03.
සදුර්ගත හස්තිජා ල
බහු විධ විශ්ව පා ල
ජගති නිරශ්ව දෙ ෂ
ප්‍රණාමිත ශසත වෙ ෂ

04.
රුචිර විමුක්ති භූ ෂ
මගධ විශිෂ්ට භා ෂ
දණ්ඩිත බහුමා ර
ඛණ්ඩිත භව භා ර

05.
මණ්ඩිත ශුභ ගා ථ
පණ්ඩිත ජන නා ථ
අඤ්චිත පදපා ථ
සඤ්චිත හිත ජා ත

06.
සාරහරි වරශය න
කාමරස නිහනය න
ලොකජන සුඛකර ණා
ලොලසුරනතවර ණා

07.

කාල ජය චතුරත ර
ශීල ධර දිවසක ර
බා ල ජන කුමතිහ ර
ආල වක දමනක ර

08.

සුර නර පුජනා යා යඨී
බුධජන බොධනා වී යඨී
පරහිත සාධනා කා යඨී
ත්‍රිභුවන ශාසනා චා යඨී

09.

ය ශුද ධිශගුණ ප්‍රණාතී ශුද
වි ශුද ධාර වරචුස්ටවි ශුද
අ ශුද නාරි බල ප්‍රහර ශුද
ප්‍ර ශුද ධාන මහත් ශඬහි ශුද

10.

ධීෂණාමය සාරසා යක
විපදකුල හෙතුහා යක
අජරාමර භූතිද යක
සංවරාචර ලොක නා යක

11.

දනචාරී පද්මා ස න සඨ
ධීරපුත චිත්‍රා ස න සඨ
වීතමොහ රුද්‍ර ස න සඨ
බොධිමුල වජ්‍රා ස න යඨ

12.

ප්‍රශැත මෘදු වා චා ච නඳ න
නිශ්‍රැත සුරපූජා වි නඳ න
සුශ්‍රැත ජන මායා න නඳ න
විශ්‍රැත කුල මායා න නඳ න

13.

ඉෂ්ට විනිෂ්ඨ සජකධිතකො ප
තුෂ්ට විරිෂ්ඨ විවර්ජිත තා ප
ශිෂ්ට විශිෂ්ඨ විනර්පිත තා ප
අෂ්ට චතුෂ්ඨ ලක්ෂණ රූ ප

14.

යොගඝබහාවගණනාභෘදතසී ම
හා ගඝදය ජන මොදනරා ම
වාක්‍ය ලෙශපරි ශොෂිතකා ම
ශාක්‍ය රාජකුල සාගරසො ම

15.

ප්‍රෙරිත ශාසන නීති විශා ල
ධාරි තබෝධි මනොහර මු ල
වාරි ත මාර වධුජන ලී ල
පූ රි ත පාරමිතා දශ ශී ල

16.

කාම ප්‍රභා තරරොවිර්දි නෙශ
හෙමප්‍රභා ශොභමාන ප්‍රදේ ශ
ශ්‍යාමප්‍රභා පූර්ණ ඕංක ශ
ව්‍යාමප්‍රභාලොක ලොක ප්‍රකා ශ

17.

චිණී බිලඟදන තොගට චන්ද්‍ර
පුණී ධරවෙෂ ද නීරාඪී චන්ද්‍ර
පූණී ගම්බ්‍යත ධීරාඪී චන්ද්‍ර
උෟණී රුවිවෙෂ ද බාලාඪී චන්ද්‍ර

18.

කූම්භෙ දයා ධිශ විශ්වත්‍ය රාජ
දම්භොලිශාලික විස්තෘත්‍ය රාජ
අම්භො ධි නිකාශ සිත්කම්‍ය රාජ
ගම්මහා ධි වාගිශ සත්කම්‍ය රාජ

19.

නිකුඤදවද් භාවාදී නවා බුඪ
සදඤදවද් ගුණාශෙෂශීලාදී බුඪ
විරිඤදවද් ප්‍රභා භෙද ශොභා දී
උදඤදවද්මහා කෙතුමාලානුවි ඪ

20.

අනුසමය ශුභසාර භා ෂණ
අතුලගුණ ධරවීත ශා ෂණ
අතිමලින භවරාග රො ෂණ
අපිරිමිතවර සීල භූ ෂණ

21.

ප්‍ර ස ත ප්‍රහිත ප්‍රසව ප්‍රවල
ප්‍රවීත ප්‍රගුණ ප්‍රමද ප්‍රවිල
ප්‍රණත ප්‍රචුර ප්‍රභව ප්‍රදල
ප්‍රකට ප්‍රණය ප්‍රතිම ප්‍රබල

22.

විසතාරි විඛ්‍යාත විශ්වනශර ණ
අසතාරිසද්ධිරබාන්ද ශිවකර ණ
ශසතාරි සතත්‍ය ගසිඬකර චරණ
විස්තාරිෂඩ්බෙද වර්ණවරකිර ණ

23. ව්‍යක්ති කර විනාස සාධුජන සඬග
භක්තිකර සම්මාන නාද මධු භෘඬග
භක්ති ධර සංසාර භෙදරණ ර ඬග
මුක්තිපුර කල්‍යාණ මොද මුනි තුඬග

24. සරසිජ නිඃ ශ්‍රැත වී විතර තනත්‍ර
සපදි නිරිස්කෘත භව භය යනත්‍ර
බුධජන ශිකෂිත බහුවිධ තනත්‍ර
ත්‍රිභුවන විශ්‍රැත භවගුණ මනත්‍ර

| | | |
|---|---|---|
| 25. | බහුලොක කඨිනීය පාවාධි | පාව |
| | ගුණ ශීල මහනිය සෙවාධි | සෙව |
| | අවිනාථ රමනීය භාවාධි | භාව |
| | ජග දෙක රු නාථ දෙවාධි | දෙව |
| 26. | තපන ශශි ශිඛීමහසසත්‍යාව | බෝධන |
| | අනයකුල මය තපසසත්‍යාව | බෝධන |
| | අපරිමිත ගුණ ච වසසත්‍යාව | සාධන |
| | සකල ජනහිත ච තුසසත්‍යාව | බෝධන |
| 27. | අගතිලක තලනීති චක්‍ර ප්‍ර | වර්ධන |
| | සුගතකර ඔහු කම චක්‍රප්‍ර | වර්ධන |
| | දුගතිමය භව කර්ම චක්‍ර ප්‍ර | වර්ධන |
| | ජගතිකෘත වර ධර්ම චක්‍ර ප්‍ර | වර්ධන |
| 28. | සිද්ධාගම සද්භාවන සඳෂිත | පාක |
| | බුද්ධාගම විද්‍යාපන විඳෂිත | ලාක |
| | ශුද්ධාගම විස්තාරණ විඳපිත | ලොක |
| | සත්‍යාගම විස්තාරණ විඳපිත | ලොක |
| 29. | මතථී මත්‍ය දන පාත්‍ර ලුප්ත ශොභ | කාඤ්චන |
| | මතථී ලබ්ධ ධර්ම ශාත්‍ර ලුප්ත ශොභ | කාඤ්චන |
| | වෘතත බෘන්ද ශීත මඤ්ජු චිත්‍රජාති | වාඤ්ජන |
| | සත්සන්තකූට ශෘඞ්ග දන්තපාද | ලාඤ්ජන |
| 30. | ප්‍ර ථී ත චරිත සඬඝගීනි නීතිසද | න |
| | අ මි ත විමල ධර්මශීල නීති සද | න |
| | බ හ ල ධවල පුඤ්ජ හාර වාරුරද | න |
| | ශිශිර කිරණ මණ්ඩලාභිරාම මද | න |

31. ජාත දිවසිය මහ මොදිති පීතාම හ
වීතමල ලොක හිත පූත කුශලා ම හ
බාහුබල ඝොර රණ මාර බහු වීර හ
රාහුනය නාවිශය පාදසර සීරු හ

32. ප්‍රේම පූගසීම භූරි සොම සාර වාච න
හී ම භාව ගාම රාග නාම රූප සුද න
වා ම දෙව කාම නාථ ශ්‍යාම පාද රොධ න
හෙ ම රාගිධාම වාරු නාම රූප ශොභ න

33. වාද බඩ විස්ථරත් කුදෘෂ්ටි ස ඍදව ය
හෙද විතත සිමහව ප්‍රපඝදව පද්ම ස ඍදව ය
පා ද පද්ම සෟවරප්‍ර ඵුල්ල පද්ම ස ඍදව ය
වෙ ද සිඬ ශෙමුසිප්‍රභග්න හෙද්‍ය ස ඍදව ය

34. අඛිල ලොක පූජිත ප්‍රභීත සර්ව ශොච න
සකල තාප වෙදන ප්‍ර භාව සංග මොච න
මධුර සාර ශිතල ප්‍ර කටක භව්‍ය වාංච න
තිරච ශෙෂ ගොචර ප්‍ර දන්ත බුධි ලොච න

35. කිරණ නිවස ප්‍රියංවචිත විතත පුෂ්කර
කලුසහර නස්චුරං නව ලලිත පුෂ්කර
ගමන සම නශ්වයං නද දමින පුෂ්කර
සකල භූවන ප්‍රියංකර චරණ පුෂ්කර

36. නිත්‍යා පෙශල නිත්‍යා දක්ෂිණ නිත්‍යා භාව තථාගත
නිත්‍යාභාසුර නිත්‍යා දෙහීන නිත්‍යා භාව තථාගත
නිත්‍යා විෂ්මය නිත්‍යා වත්සල නිත්‍යා මොද තථාගත
නිත්‍යා මංගල නිත්‍යා සුන්දර නිත්‍යා පූජ්‍ය තථාගත

37. ත්‍රිවිධ ශුභ චලනවර ජලජ නිභ යුගල
විනය මය විවිධමනු සමිත දුරි තගල
මචිත බහු විෂයහර හරිත භව යුගල
ප්‍රණීත සුර මකුට වණි ඝටින පද යුගල

38. හෙලා විරචිත දෙලා හිතජන මුලාගමවිධි දීපනවා ට
භාලා හල නිභ ශාලා භවශුභ ලීලා විදලන ශාසනනාධා ට
බාලා නයලති ජාලාදරහර ශීලායුධ ධර චාරිත කූ ට
කෝලා හල කළ නාලාගිරි ගජ කාලාකෘතිමද වෙශවිභා ට

39. වන මුදිත විස්පෂ්ට මධුරතර නා ද
ජන හෘදය මධ්‍යසථ කමල මෘදු පා ද
වින යල්ල විපිනත දුරිත කුල භෙ ද
අන වරත සඩ මම විතරණ විනො ද

40. අරුණ පදතල සකල විෂය කවිමල දශවිධ මනි බ ල
කරුණ ජල නිධි ලහරි පරිකර සතත කුසලිත මහිත ල
විශද දිනමණි කිරණ විකශිත කමල මෘදුනල කරත ල
දශදිගුප ගත සුරභිකුලවර වදන විකශිත පරිම ල

41. අනඝමති මනොඥං ධර්ම රාජස්‍ය ගද්‍යං
ලිඛති පඨති යොවා සාරදං යං ශෘණොති
ත්‍රිභුවන භව නාතතඃ ප්‍රප්‍ය භොගාන ශෙෂා
නනුභවති සනිත්‍යං ශාන්ත නිර්වාණ සොඛ්‍යම්

# ස ක ස් ක ඩ ය

<u>නමඃ ශ්‍රී ඝණාය</u>

**දීපඞ්කරාචිහය මුනිශ්වර පාදමූලෙ**
**සන්ත්‍යජ්‍ය ලබ්ධම මෘතං කරුණාං විධාය**
**අත්‍යා හිතං පරහිතං සුකෘතං විශේෂාත්**
**සිද්ධං නමෝස්තු සුගතාය ජග්ධිතාය**

තථාගතයන් සංසිද්ධාශෙෂ සම්භාර විශේෂ සාක්ෂාත්කරණීය සර්වපාපමල ප්‍රක්ෂාලනක්ෂම ආත්මමොක්ෂ නිරපෙක්ෂවැ උදය ව්‍යය භංග්‍රභයාදීනවාදී නවමහා විදර්ශනඥාන පරම්පරාධිගත නිර්වාන මහා සසරට පරිධාවමාන සමස්ත සත්වමාතඞ්ගයා මහාකරුණාංකුශයෙන් හම්නවැ ..... ජාති ජරාභඞ්ග භංගිර භඞ්ග භයානක රාග වෙෂා මෂීමදමාන සිරම්භාදී කෙලශමකරනිකරාකිණී සංසාර මහාණී වාවතීණී වාෂෂ්ටී දෘෂ්ටි ජාලාවබද්ධ සර්වසත්ව සමුද්ධරණානු බද්ධ බුද්ධි ඇතිවැ - කායජීවිත. නිරපෙක්ෂාභිජාත නිර්භාරභ්‍ය හිත සර්වලොකෙක දීපායමාන දීපඞ්කර තථාගත ව්‍යාකරණාභි-ෂකයෙන් උදණීක්ලෙශ මලාපගමකොට නිර්මලවැ ..... අනෙක මුක්තිමුක්තයාත සම්‍යක්සම්බොධිසම්භාවරබරාලඞ්කතායෙන් සමලංකෘතවැ... ශශ්වදුපාශ්‍යමාන පාරමිතා දුතිකානුනියමාන ධර්ම රාජ ලක්ෂ්මී සඞ්ගම

ගමන් මඞ්ගලයයට ආරම්භ කොට... කල්පකොටිසත සහශ්‍රාධික චතුරාසංඛ්‍ය කල්පකාලාභ්‍යා සාතිශය සවාත්මීකෘත සම්සම්ප්‍රද, දනනිදන දනසීල නෛෂ්ක්‍රම්‍ය ප්‍රඥවීයර්‍ය ක්‍ෂාන්ති සත්‍යාධිෂ්ඨානමෛත්‍රුපෙක්‍ෂා ලක්‍ෂණ දසවිධ පාරමිතා සාගරයෙහි පාරප්‍රාප්තවැ... මාරාතීචක්‍රකාර මනසන්න බුද්ධාංකුර මාහා යොධාඩිවුෂිත තුෂිත භාවනාරූඪ...... ශුද්ධානුරාග වර්ජිතා මිතා මරවරවධූ විධූයමාන චාමිකරචාරු චාමර ධවලී කෘතොදර පාණ්ඩරතර කීත්තිවිමානයෙහි වැඩවසමින්..... භක්ත ප්‍රෙමාතීගාරාවනත සර්ව සුරාසුරවර චක්‍රවාරු චූජාමණී මරිවිසංචය පරිචුම්බී. තවරණනධ මබපූජාලාභිෂෙකයෙන් භුවනත්‍රයට අභිෂෙකදී.... දුගීති දුගීාභිමුඛව පරිධාවමාන සමස්ත සත්ව සනදශීනයෙන් සමුව්ග්නව දිව්‍ය බ්‍රහ්මයන් විසින් සමාරාධිතව.... මහා සමමත පරම්පරානුයාත ශුද්ධ සූයර්‍යවංශාභිජාත සර්වගුණගණාභරණ විභූසිත කීර්තිමාලා පරිශුද්ධ ශුද්ධොදන මහාරාජොපනිශ්‍රයෙන් අපිරිමිත පුණ්‍යසම්භාර රූපලාවණ්‍යය ගුණොපෙත මහාමායා දේවීන් ගභීචෛත්‍යානතගීගභීයෙහි ආත්මීය ප්‍රතිසන්ධානධාතු නිධානකොට ස්පටික චෛත්‍යානතගීත විරාජමාන කනක ප්‍රතිමාකාරයෙන් දිළිසෙමින් අනූනාධික දශමාසයක් මාතෘගභීයෙහි වැස.... වස නතැමදමොදමාන මුඛර මධුරකර හැරිභවතාංකූරිත කුසුමිත එලිතපල්ලවලතා විතාන විචනවිචිත්‍ර විශාලාශල සල්ලකීකෙසර නක්තමාල තමාලනිප කදම්බාදී තරුසණඩ මණ්ඩිත ලුම්බිණී වනොද්‍යානයෙහි මතෘගභීයෙන් ප්‍රසූතවැ.... මහා බ්‍රහ්මොපානිත සවණීජාලයෙන් ලොකපාල දිව්‍යපුත්‍රොනිත අජිනචම් යෙන් ධගනාසත්තකෙක ශෙඛර භාවයට සම්ප්‍රාතව.....අශෙෂ දෙෂාන්ධකාර නිකර කිරාකරණ සමුද්ගත තරුණ තරුණි මණ්ඩාලනුකාරයෙන් දිළිසෙමින් දස දිසා විලොකණය කොට... අනනතාපරිමාන ලොකධාතු පයඊපන්න සමසත සතව නිකායෙහි ආත්ම සදසාධීක පුද්ගලානතරක්හු නැතිසේ දැක.... උත්තර දිශාභිමුඛව සප්තපදව්‍යති ක්‍රමභාරාවසානයෙහි වැඩ සිට... "අගෙගා හමස්මි ලොකසස ජෙටෙඨා හමස්මි ලොකසස සෙටෙඨා හමස්මි ලොකසස

අයමනති මාජාති නත්ථිදනි පුනබ්බවෝ" යි යනාදීන් අභීත සිංහනාද කොට.... සර්වසුරාසුරවර වත්තමාතාඞග මානමද පරිශොෂණ නිපුණ සිංහනාද පරිපූරිතා- ශෂභුවනකුහර ඇතිව ශාක්‍යාධි රාජසිංහ පොතකතෙම චතුර චතුරාශීති සහශ්‍රකුල ප්‍රභෙද විස්තිර්ණ බන්ධුවර්ගයා මධ්‍යයෙහි විරාමානවැ ශුක්ලපක්ෂාභිවර්ධමානි චන්ද්‍රමණ්ඩලානුකාරයෙන් ක්‍රමාභි වෘද්ධවැ.... ප්‍රභාසවරතර වරාඞගනා මධ්‍යයෙහි විරාජමාන චන්ද්‍රලෙඛනුකාරී යසොධරා ප්‍රමුඛානෙක කොට නාටකස්ත්‍රීන් පරිවෘතව.... ප්‍රතිදිනාරබ්ධ මඞගල කපිලවස්තු මහානගරවරයෙහි ක්‍රීඩානුභාවයෙන් එකුන්ත්‍රි ශත් සංවත්සරාතික්‍රාන්ත කොටැ.... ජරාජිණී රොගාවතීණී මරිණාවතීණී පූර්ව නිමතත සත්ව සන්දර්ශනයෙන් සමුඵවග්නවැ... ප්‍රවුජිත රූපසන් දර්ශනයෙන් නිවෘතතව නෛෂ්ක්‍රම්‍ය භිමුඛව මානසින් සන්තුෂ්ටව ජන්නනම් අමෘත්‍යවතියව- අනෙකකොටිසතසහශ්‍ර චක්‍රවාලාන්ත රාලු පරපූරිත ව්‍ය බ්‍රහ්ම ගණාකීණී පාරිජාත මන්දර මකරන්ද බින්දු සන්ධූරිතාඞග සුන්දරතර චතුරකර තුරංග යානයෙන් ප්‍රයානය කොට ගංගාතීරයට සම්ප්‍රාප්තවැ....සර්වාභරණ විභූෂිත කනක වර්ණ දෙහශොභා ඇතිවන බැවින් සුපුෂ්පිත කරණාකර තරු ශිඛර සමුද්ගත ගුමරාවලී ලීලායෙන් ආත්මීය බඞගධරා සමුච්ජින්න කෙශධාතු ආකාශයෙහි විහිද.. ඝටීකාර මහාබ්‍රහ්මොපනිත විශිෂ්ටාෂ්ඨ පරිෂ්කාරයෙන් ප්‍රවුජිතවැ... ප්‍රවුජ්‍යසුඛස්මෘති රසාස්වාදයෙන් සප්තහාතික්‍රාන්තකොට රජග්‍රහනගරවරයෙහි භික්ෂාටනයෙන් සන්තර්පිතව ෂට්සංවත්සර මාත්‍රයක් ප්‍රධාන භූමියොගකොට කෂ්ටවුත සමාදනයෙන් මොක්ෂයාගේ අලම්ධභාවය ලොකයාහට ප්‍රකාශ කොට සුජාතොපණීත ක්ෂිරපායාස ප්‍රතිග්‍රහණයෙන් රූපකායානුග්‍රහකොට... සවස්තිච්ජොපනිත කුශමුෂ්ටිග්‍රහණයෙන් මරාරාතිසංග්‍රාමභූමි ස්ථානීය බොධිමණ්ඩලයට සම්ප්‍රාප්ත..... පෘථිවි සමුද්භෙදෙදගත කුසුමපපීඨක වරවාරණ සමාරූඪව චතුරඞගසමන්විව වියර්‍යාධිෂ්ඨානයෙන් පාදබන්ධනය කොට.... තත්කාල සමයාන සංග්‍රාමාති භීෂ්ණ මත්ත මෘතඞගතුරංගාඩම්බර හෂීහෙසාරව බධිරි කෘතාශෙෂ ත්‍රිභුවන භවන

පටපාටන පටුපටගපණවදුන්දුභීධවති ප්‍රලයාශනිමාසම්පාත නිඝෝෂයෙන් ඝොෂවූ... දෙර්දණ්ඩ මණ්ඩලධූෂීත කොදණ්ඩ දණ්ඩ කණ්ඩ කම්පනභීන්දිවාලකරවාලාධි චන්ද්‍රවකාදී විවිධායුධ සහ සුදුර් ාර සපිරිවාර මාර පාරාජය කොට.... ප්‍රථමයාම සමාධිගත පූර්වෙනි වාසානුස්මෘති ඥනලොකබලයෙන් අනාගතාතීත කාලවර්ති ඥනත මොජාල ප්‍රදලනයකොට... පශ්චිමයාම සමධිගත සවාසනා සර්වක්ලේෂ සමුච්ඡේද සමස්තෘෂ්ටාඞ්ගායර්මාර්ගඥණ ලක්ෂණ අශ්‍රවක්ෂය කරාභිඥනාලොකබලයෙන් වර්තමාන ක්ෂනනතරාඥාන තිමිර පටල පූට පාටනය කොට මෙසේවූ ත්‍රිවිද්‍යාඥනා ලොකබලයෙන් අධවත්‍රිතශ සර්වදෙෂාන්ධකාර දුරිකරණයෙන් සංස්කාර විකාර ලක්ෂණ නිර්වාණ ප්‍රඥප්තිය යන පඤ්චවිධ ඥෙය මණ්ඩලයෙහි ඓශ්වර්ය කෙරෙමින්..... අනාවරණ ඥනාභිෂෙකයෙන් සර්ව ධර්මාධිරාජ පදයෙහි සප්‍රතිෂ්ඨිතව...ස්ථානභවයොනිං ගතිවිඥනස්ථිති සත්වාවාසභෙද හිනනසර්වසත්ව වර්ග ශ්‍රිතක්ලෙශාරිවර්ගසමුච්ඡද චතුරචතුරාසීති සහශ්‍ර ධර්මස්කන්ධ මහානගරවරයට සම්ප්‍රාප්තව.... චතුරවෛසාරද්‍ය දශබල චතුර්දශ බුද්ධඥනාෂ්ටා දශ බුද්ධ ධර්මද්වාත්‍රිංශවර මහා පුරුෂ ලක්ෂණයෙන් හා අශිත්‍යානුබ්‍යඤ්ජන බ්‍යාමප්‍රභා කේතුමාලාලංකාරයෙන් විරාජ මානව .... තථාගතවර ධර්මචක්‍රවර්ති තමා නානාදෙශයෙහි නානාකාලයෙහි නානාවිධ විනෙය සත්වාසයානුශය චරිතාධිමුක්තිවශයෙන් සද්ධර්මා මෘත වර්ෂා කෙරෙමින් සර්වසම්පන්න ශ්‍රාවස්තමහා නගරවරොපණි ගෘයකොට... සද්ධර්මාධිරාජධානි ස්ථනීය ජේතවන මහාවිහාරාධිමෙහි වැඩවෙසෙමින් දෙසුවාවූ සුවාසූ දහසක් ධර්මස්කන්ධයට අනතගීත වූ විසාලා මහනුවර ජනපද රොගභය පලවා.... කෙළ ලක්ෂයක් සක්වලෙහි ආඥ පැතිර දිළිසෙමින් සිටි රුවන් සූත්‍රයෙහි වදළතාක් ආඥගුණ තෙජොබල මෛත්‍රී පුණ්‍ය ප්‍රභාවයෙන් සියල්ලෝ වැස්සන්ටද මටද සේනුසේ වියයුතුයි.

සර්වනතරායවර මහාභිනික්මන් සකස්කඩ නිමි.

සි ද්ධි ර ස්තු

# නරසීහ ගාථා

01. චකක වරංකිත රතතසුපාදෙ
ලකඛණ මණ්ඩිත ආයත පණ්හි
චාමර ඡතත විභූෂිත පාදෙ
එසහි තුයහ පිතා නරසීහො

02. සක්‍ය කුමාරවරො සුඛුමාලො
ලකඛණ චිත්තිත පුණ්ණ සරීරො
ලොක හිතාය ගතො නරවීරො
එසහි තුයහ පිතා නරසීහො

03. පුණ්ණ සසංඛ නිභො මුඛවණ්ණො
දෙවනරාන පියො නර නාගො
මතත ගජින්ද විලාසිතගාමි
එසහි තුයහ පිතා නරසීහො

04. ඛත්තිය සම්භව අගග කුලීනො
දෙවමනුසස නමස්සිත පාදෙ
සීල සමාධි පතිට්ඨිත චිත්තො
එසහි තුයහ පිතා නරසීහො

05. ආයත යුත්ත සුසණ්ඨිත නාසො
ගොපමුඛො අභිනීල සුනෙතො
ඉන්ද ධනු අභිනීල භමුඛො
එසහි තුයහ පිතා නරසීහො

06. වට්ටසුමට්ට සුසණ්ඨිත ගීවො
සීහහනු මිග රාජ සරීරො
කඤ්චන සුචජවි උතතම වණ්ණා
එසහි තුයහ පිතා නරසීහො

07. සුනිද්ධ සුගම්භිර මඤ්ජුසු ඝොසො
හිංගුල බන්ධු සුරත්තසු පිට්හො
විසති වීසති සෙතසු දනෙතා
එසහි තුයහ පිතා නරසීහො

08. අඤ්ජන වණ්ණා සුනීලසු කෙසො
කංචන වට්ට වසුඬ ලලාටො
ඔසධීපණ්ඩර සුඬසුඋණෙණා
එසහි තුයහ පිතා නරසීහො

09. ගචඡති නීල පථෙවිය චන්ද
තාරගණා පරිවෙඪිත රූපො
සාවක මජ්ඣගතො සම්තින්දෙ
එසහි තුයහ පිතා නරසීහො

නිමි

# නම් පොත

## නමෝ බුද්ධාය

සගම
පස්ගම
අරත්තන
මාදන්වල
විල්වල
කඩදෙර
මොරපාය
දිඹුල
පුසුල්පිටිය
නියම්ගම්පාය ස්ථානය
වනවාසගොඩ
සැලව
අරම
මැදිරිගිරිය
දික්පිටිය
බම්පනේ
කාරියගම
දඩගමුව
අළුත්නුවර
පරණ නුවර
මාවෙල
මාකඩවර
හිඟුල
කප්පාගොඩ
පදීදෙර
උතුරාවල
අම්බුළුගල
දනගිරිගල

වාගිරිගල
ලෙනගල
වතුර
අලවතුර
මාකුරාව
කවුඩුගම
බිසෝවෙල
දැදිගම
අරන්දෙර
දෙරවක
මඩබඩවිට
තොටගෙදර
මදුරුපිටිය
අත්තනගල්ල
උඟුරුවෙල
ගොඩගෙදර
දෙරණෑගොඩ
යටවත්ත
රාගම
මීගමුව
දඹදෙණිය
බෙලිගල
නවගමුව
බමුණුගම

වට්ටාරම
වතුදෙණිය
පුහුරිය
ගල්බඩගම
කොල්ලුර
ඔකඳපල
උඩපළ
අල්ගම
නවකෙළගමුව
ඇත්කඳවිහාරය
කුරුණෑගල
කුරුවෙනියාගල
ආඬාගල
ඉබ්බගල
යක්දෙස්සාගල
නායගම
හංවැල්ල
කඩිකාව
මලඟනේ
කබල්ලෑලෙන
නියඳවනේ
නාගවිහාරය
රැස්වෙහෙරුව
තලංගමුව

පෙරියකඩුව
දේවගිරිවිහාරය
සංගමුවිහාරය
උතුරුපච්විහාරය
බුජස්ලෙන
යාන්ලෙන
ජයකඩුලෙන
සැගෑලෙන
කුඹුරුලෙන
රිදීලෙන
රම්බඩගල්ල
දෙල්විට
විල්ගම
අස්ගිරිය
රුසීගම
ඇම්බැක්ක
මිලිලවානය
බඹාවිහාරය
රංගිරිදඹුල්ල
සිහිගිරිය
කලාවැව
බළල්ලෑව
අනුරාධපුරයෙහි ශ්‍රී
මහා බෝධින් වහන්සේ
ලෝවාමහාප්‍රාසාද
ස්ථානය
මිරිසවැටි විහාරය
අභයගිරි විහාරය
ජේතවන විහාරය
රත්නමාලි චෛත්‍යය
ථූපාරාම චෛත්‍යය
මිහින්තලය
අටසැටලෙන
නිතුපත්පාන
සුරුළුමහමුනියාව
මුන්නේස්සරම
ඇත්තල
මක්කම
මන්නාරම
මාන්තෝට්ටම
පොන්පරිප්පුව
මල්විල
දෙමළපට්ටනමෙහි
නාගකෝවිල
කඳුරුගොඩ විහාරය
තෙලිපොළ
මල්ලාගම
මිණිවංගමුවිහාරය

තන්නිදිවයින
අගිනිදිවයින
නාගදිවයින
පුවඟුදිවයින
කාරදිවයින
මොල්ලියාවල
තිරිකුණාමලය
විල්ගම්වෙහෙර
තිස්සමහ වෙහෙර
ඉලන්දගොඩ
කඳුරුකෝට්ටයෙහි
ඇතුබදය
විජයොත්පාය
දෙනානකය
බගිරිනකය
කපිලවිහාරය
ඉසිපතනාරාමය
කුසිනාරාමය
පූර්වාරාමය
දක්ෂිණාරාමය
පශ්චිමාරාමය
උත්තරාරාමය
සළුම්ණිසෑය
සිළුමිණිසෑය

දෙමළමහසෑය
පොළොන්නරු විහාරය
සුළුන්නරු විහාරය
සිතුල්පවු විහාරය
ධනංජය විහාරය
කුකුළුවාවිහාරය
දිඹුලාගල් විහාරය
නකා වෙහෙර
මියුගුණා වෙහෙර
සොරොන්නාතොට
බදුලු වෙහෙර
යුදඟනාපිටිය
රුහුණුබද කතරගම
උග්ගල්අලුත්නුවර
තඹගමුව
මුල්ගිරිය
ඔවාගිරි විහාරය
දෙවිනුවරෙහි
දිව්‍යරාජභවනය
ඔත්පිළිමගෙය
සිටිපිළිමගෙය
අල්ගණෝ
වැලිගම අග්‍රබෝධි
විහාරය

පරගොඩ විහාරය
තොටගමු විහාරය
ගලපාත විහාරය
බෝධිමළු විහාරය
වනවාස විහාරය
බෙම්වෙහෙර
බෙම්තොට
කළුතොට
සොරණ
විසිදෘගම
කොතලාවල
රඹුක්කන
පාණදුරේ දේවාලය
බෙල්ලන්විල
පැපිළියාන
නාවින්න
විජයාරාමය
සුභද්‍රාරාමය
ජයවර්ධන කෝට්ටයෙහි ඔත්පිළිමගෙය
සම්මුඛ දේවාලය
කිත්සිරිමෙවන්
කැලණිය
රජමහ කැලණිය
විභීෂණ දේවාලය

වැලිවිට
බොල්ලෑගල
හංවැල්ල
සේවාගම
දිසාපති නුගය
කඩුදෙවොල
බෝමිරිය
කෙහෙල් බටුවාව
අතුරුගිරි විහාරය
දෙණගමුව
දෙල්ගමුව
බටුගෙදර
දෙණවක
සපරගමුව
ගිලීමලය
සමන්තකූට පර්වතය
දිවාගුහාව
බල්ලාහෙල
සිඳගල
කළුගමුව
ගංගාතිලක විහාරය
කුඹල්ඔළුව
අළුදෙණිය
කොටකේදෙණිය
ඉළුපැන්දෙණිය

සේන්දෙණිය
නිග්ගම්මන
අරත්තන
සන්තානාගොඩ
වේගිරිය
අම්බැක්ක
ලංකාතිලකය
වටදගෙය
ගඩලාදෙණිය
දැලිවෙල
ගඟුල්දෙණිය
උරුලෑවත්ත
කොටබෝගොඩ
රංමුංගොඩ
තෙල්දෙණිය
මැණික්දිවෙල
මොණරාගොඩ
කොළුගල
වල්ගම්පාය
දන්තොටවතුර
සියඹලාගොඩ
දෙඩම්වල
දියකෙළිනාවෙල
සූරියගොඩ
කොබ්බෑකඩුව

ගන්නොරුව
කුළුගම්මන
මාලගම්මන
අත්තරගම
මැදවෙල
ගල්ලෑල්ල
දෙරපිල්ල
අලවතුගොඩ
කොහොන
තිබ්බටුවාව
ඇඹිල්ල විහාරය
ආලෝක විහාරය
කුරුවාබෝගම්බර
කවුඩුවෙල
දුනුවිල
ඇඹල
නිත්තවෙල
සිරිමල්වත්ත
අමුණුගම
ගංගාරාම විහාරය
සෙංකඩගල නුවර
අලුත් විහාරය
පරණ විහාරය
නාගවිමානය
උපෝසථාරාමය

ශ්‍රී දංෂ්ට්‍රා දළඳා මන්දිරය ඇතුළු වූ සියලු විහාර දේවාලවල අධිපති දෙවි මහරජාණන් තමනුත් තමන්ගේ සහාය පිරිවර දෙවියනුත් සන් දෘෂ්ටි සම්භක්ත දෙවියනුත්, උපවෙනෙහි දෙවියනුත්, නොහැර කැඳවාගෙන මඞගලසූත්‍රා දී බණ අසනු පිණිස ඒම සමග මහා සංඝයා වහන්සේට අභිමත දෝ අභිමතදෝ අභිමතදෝ! අභිමතයි, අභිමතයි, අභිමතයි, සමග මහසංඝයා වහන්සේ සග ව වදළ මෙහෙවර සංඝානත්තිය නුගුළුවා විය යුතුයි.

නම් පොත නිමි.

# මඟුල් ලකුණ

සවස්තික දෙක ය
සිරිවස දෙක ය
නඳවට දෙක ය
සෝවැති දෙක ය
අවතංස දෙක ය
වර්ධමාන දෙක ය
භද්‍රපීඨ දෙක ය
ප්‍රාසාද දෙක ය
තෝරණ දෙක ය
ශ්වේතඡත්‍ර දෙක ය
ඛඩ්ග දෙක ය
තාලවෘත්ත දෙක ය
මයුර හස්ත දෙක ය
චාමර දෙක ය
උන්හිට දෙක ය

මණි දෙක ය
සුමනදම දෙක ය
නීලොත්පල දෙක ය
රක්තෝත්පල දෙක ය
රක්තපද්ම දෙක ය
ශ්වේතොත්පල දෙක ය
ශ්වේතපද්ම දෙක ය
පුන්කලස් දෙක ය
පූර්ණපාත්‍රා දෙක ය
සමුද්‍ර දෙක ය
චක්‍රවාටපර්වත දෙක ය
හිමවාටපර්වත දෙක ය
මහමේරුපර්වත දෙක ය
සූර්ය මණ්ඩල දෙක ය
චන්ද්‍ර මණ්ඩල දෙක ය

| | |
|---|---|
| සපරිවාර සතර මහද්වීප | දෙක ය |
| සපිරිවාර සප්ත රත්න | දෙක ය |
| චක්‍රවර්ති රාජයෝ | දෙදෙනා ය |
| දක්ෂිණාවෘත සෙවත සංඛ | දෙක ය |
| සවර්ණ මත්ස්‍ය යුගල | දෙක ය |
| චක්‍රායුධ | දෙක ය |
| සප්ත මහා ගංගා | දෙක ය |
| සප්ත මහා සීදන්ත සාගර | දෙක ය |
| සප්ත මහා ශෛල | දෙක ය |
| සප්ත මහා තටාක | දෙක ය |

සුපර්ණරාජයෝ දෙදෙනා ය
සුංසුමාර රාජයෝ දෙදෙනා ය
ධජ දෙක ය
පතාක දෙක ය
සවර්ණ පර්වත දෙක ය
සවර්ණ වාලවිජිනි දෙක ය
කෛලාස පර්වත දෙක ය
සිංහ රාජයෝ දෙදෙනා ය
ව්‍යාඝ්‍ර රාජයෝ දෙදෙනා ය
වලාහක අස්ස රාජයෝ දෙදෙනා ය
උපොෂථ හස්ති රාජයෝ දෙදෙනා ය
වාසුකී නාගරාජයෝ දෙදෙනා ය
හංස රාජයෝ දෙදෙනා ය
වෘෂභ රාජයෝ දෙදෙනා ය
ඓරාවන හස්තිරාජයෝ දෙදෙනා ය
සවර්ණ මකර රාජයෝ දෙදෙනා ය
චතුර්මුඛ සවර්ණ නෞකා දෙක ය
වත්සක ධෙනුවෝ දෙදෙනා ය
කිම්පුරුෂයෝ දෙදෙනා ය
කින්නරාඞගනාවෝ දෙදෙනා ය
කුරවීක රාජයෝ දෙදෙනා ය
මයුර රාජයෝ දෙදෙනාය
ක්‍රෞඤ්ච රාජයෝ දෙදෙනාය
චක්‍රවාක රාජයෝ දෙදෙනාය
ජීවන්ජීවක රාජයෝ දෙදෙනාය
ෂට්විධ දිව්‍යලෝක දෙකය
ෂෝඩෂවිධ බ්‍රහ්මලෝක දෙකය

යනාදී දෙසිය සොළසක් මඞගල්‍ය ලක්‍ෂණයෝ බුදුන්ගේ ශ්‍රීපාද පත්ලෙහි පිහිටා ඇත්තේ ය.

ගණ දෙවි හෑල්ල

වදන් කවි පොත

බුද්ධගජ්ජය

සකස්කඩය

නරසිංහ ගාථා

නම් පොත

මංගුල් ලකුණ